# wd¾:sl úoHdj
# 12 fY%aKsh

ieeliqu tï hQ wd¾ l=,r;ak

r$ fldaka.ia;ekak uyd úoHd,h

# නිපුණතාව 1 :-

ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මක ව විග්‍රහ කරයි.

# අන්තර්ගතය

- ආර්ථික විද්‍යාව හැදින්වීම
- සාර්ව ආර්ථික විද්‍යාව හා සූක්ෂ්ම ආර්ථික විද්‍යාව
- යථානුරූපි හා අභිමතානුරූපි ප්‍රකාශ
- නිෂ්පාදන සාධක
- මූලික ආර්ථික ප්‍රශ්න
- ආර්ථික පද්ධති
- නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර
- ස්ථාවර ආවස්ථික පිරිවැය
- වැඩෙන ආවස්ථික පිරිවැය
- සූක්ෂ්ම ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් ඇසුරෙන්
- සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් ඇසුරෙන්

# ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචන.

- ඇරිස්ටෝටල් (ක්‍රි.පූ. 385-323)
  ග්‍රීසිය

➢ **ආර්ථික විද්‍යාව යනු කුටුම්බ කළමනාකරණයයි**

- තම ආදායමෙන් වැඩිම ප්‍රයෝජනයක් ගැනීම සඳහා සම්පත් අරපිරිමැසමෙන් හා ඥානාන්විත ව භාවිත කළ හැකි ආකාරය පිළිබඳව අවධානය යොමු කර ඇත.
- මුල් කාලයේ සීමිත පරාසයක පැවති බව

# ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචන.

- **ඇඩම් ස්මිත්** **(ක්‍රි.ව. 1723-1790)**
  ස්කොට්ලන්තය

> ආර්ථික විද්‍යාව යනු ධනයේ ස්වභාවය හා ධනයට හේතු විමර්ෂණය කිරීමයි.

- නූතන ආර්ථික න්‍යායේ පියා ලෙස සැලකේ
- "ජාතීන්ගේ ධනය" නම් කෘතියෙහි ඉහත අදහස ඇතුළත් ය.

# ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචන.

- ඇල්ෆ්‍රඩ් මාර්ෂල් (ක්‍රි.ව. 1842-1924)
  බ්‍රිතාන්‍ය

> ආර්ථික විද්‍යාව යනු මිනිසා හා ඔහුගේ **ද්‍රව්‍යාත්මක** සුබසාධනයට සම්බන්ධ දෑ අධ්‍යනය කිරීමයි .

- සුබසාධනවාදය කෙරෙහි අවධානය යොමු කර ඇත.

# ආර්ථික විද්‍යාව යනු

- විකල්ප භාවිත සහිත හිඟ සම්පත් හා අසීමිත මිනිස් වුවමනා අතර සම්බන්ධතාව  අධ්‍යයනය කරන විෂය ආර්ථික විද්‍යාව යි

එනම්

- සීමිත සම්පත් වලින් අසීමිත මිනිස් වුවමනාවන් සපුරාගන්නේ කෙසේදැයි හදාරනු ලබන විද්‍යාව ආර්ථික විද්‍යාව යි.

- හිගකම මූලික පදනම ලෙස යොදාගෙන ඇත.

# ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම.

- රාජ්‍ය පාලනයේදී පාලකයින්ට වැදගත් වීම.
- තාර්කික ව කටයුතු කිරීමේදී පුරවැසියන්ට වැදගත් වීම.
- දේශීය හා විදේශීය ආර්ථික සංසිද්ධි තේරුම් ගැනීමට වැදගත් වීම.
- නිවැරදි තීරණ ගැනීමේදී ආයෝජකයින්ට වැදගත් වීම
- ආර්ථික ප්‍රතිපත්ති සැසඳීම සඳහා ඡන්ද දායකයන්ට වැදගත් වීම.
- පාසල් සිසුන් තාර්කිකව සිතීමට හුරු කිරීම.
- කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා පාරිභෝගිකයින්ටත්, නිෂ්පාදකයින්ටත් වැදගත් වීම.
- වඩාත් හොඳ රැකියාවක් තෝරා ගැනීමේදී වැදගත් වීම.

# මිනිසා සමාජීය සත්වයෙකි. සමාජයක් තුළ මිනිසා විවිධ කටයුතු සිදුකරයි.

**සමාජය**

- නායකයන් පත් කරමින් විවිධ ප්‍රතිපත්ති වලට අනුව ජන සමාජය පාලනය කිරීම
- භාන්ඩ හා සේවා නිපදවමින්, හුවමාරු කරගනිමින්,භෞතික අවශ්‍යතාවන් තෘපතිමත් කර ගැනීම
- හිතමිතුරු, අසල්වැසි, ඥාති සමූහයා සමග එක්ව කටයුතු කරමින් සංස්කෘතික ජීවිතයක් ගතකිරීම
- සහ තවත්.......

මේ අතරින්,

භාන්ඩ හා සේවා නිපදවමින්,
හුවමාරු කරගනිමින්,
භෞතික අවශ්‍යතාවන් තෘපතිමත් කර ගැනීම

හෙවත්,

මිනිසාගේ ආර්ථික හැසිරීම් පිළිබඳ
අධ්‍යනය කරන විෂය ආර්ථික විද්‍යාවයි

# ආර්ථික විද්‍යාව ප්‍රබල සමාජීය විද්‍යාවකි. එය සමාජීය විද්‍යාවක් විමට බලපාන හේතු පහත දැක්වේ.

- ආර්ථික විද්‍යාව මගින් මිනිසුන්ගේ ආර්ථික හැසිරීම විග්‍රහ කිරීම.
- මිනිස් හැසිරිම කාලය, ප්‍රදේශය, සමාජ පරිසරය වැනි සාධක කෙරෙහි සංවේදිවන බැවින් ස්වභාවික විද්‍යාවන් වල මෙන් න්‍යායන් හෝ නියතයන් මෙබඳු සමාජීය විද්‍යාවන්වල ගොඩනැගිය නොහැකි වීම.
- ගොඩනැගෙන ආර්ථික මතවාද පර්යේෂණාගාර තුළ සනාථ කළ නොහැකි වීම.

**ආර්ථික පැතිකඩ**

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය
- හුවමාරුව
- පරිභෝජනය

ඉහත කටයුතු හා සම්බන්ධ මිනිස් ක්‍රියාකාරකම් ආර්ථික පැතිකඩ යනුවෙන් හඳුන්වයි

මේ අනුව,

- මිනිස් ක්‍රියාකාරකම් වලින් බොහෝ ප්‍රමාණයක් ආර්ථික පැතිකඩට අයත් වේ
- බොහෝ රටවල් මහුණ දෙන ප්‍රමුඛ ප්‍රශ්න සියල්ලක්ම ආර්ථිකමය ස්වරූපයක් ගනී.

ඒ නිසා සමාජීය විද්‍යාවන් අතර

අග රැජිණ

ලෙස සැලකෙන්නේ **ආර්ථික විද්‍යාවයි**



මේ අනුව


- භෞතික වුවමනා සපුරා ගැනිම සඳහා
- භාණ්ඩ හා සේවා පරිභෝජනය කරමින්
- යහපත් ජන ජීවිතයක් ගත කිරිම සඳහා
- පුද්ගලයන් හා සමාජය ක්‍රියාත්මක වන ආකාරය හා එහිලා තීරණ ගනු ලබන ආකාරය

ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළින් අධ්‍යනයට ලක්කෙරේ.

# ආර්ථික විද්‍යා සංකල්ප

- සූක්ෂම ආර්ථික විද්‍යාව
- සාර්ව ආර්ථික විද්‍යාව
- යථානුරූපී ආර්ථික ප්‍රකාශ
- අභිමතානුරූපී ආර්ථික ප්‍රකාශ

# විවිධ පුද්ගලයන්, විවිධ ආයතන, විවිධ ආර්ථික විචල්‍යයන් ආදී රාශියක ඒකතුවෙන් ආර්ථිකයක් සකස් වේ.




එක් ඒකකයක් පිළිබද හැදෑරීම **සූක්ෂ්ම ආර්ථික විද්‍යාවයි**

ආර්ථිකයේ සමස්ථ කරියාකාරීතවය හැදෑරීම **සාර්ව ආර්ථිකවිද්‍යාවයි**

# සූක්ෂ්ම ආර්ථික විද්‍යාවේදී අධ්‍යනය කෙරෙන තේමාවන් කීපයක්.

- යම් භාණ්ඩයක ඉල්ලුම, සැපයුම, මිල තීරණය වීම ආදිය අධ්‍යයනය කිරීම.
- නිෂ්පාදන ශ්‍රිතය
- නිෂ්පාදන පිරිවැය
- එක් එක් භාණ්ඩවල වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය
- වෙළෙඳපොළේ පාරිභෝගික හැසිරීම
- ව්‍යාපාර ආයතනයක වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය
- හිඟකම
- ආන්තික පිරිවැය
- විකල්ප අතරින් තේරීම් කිරීම

# සාර්ව ආර්ථික විද්‍යාවේදී අධ්‍යනය කෙරෙන තේමාවන් කීපයක්.

- සමස්ත නිමැවුම් මට්ටම
- සමස්ත ආදායම් මට්ටම
- ආර්ථික උත්පාත හා අවපාත
- උද්ධමනය
- සේවා නියුක්තිය
- විරැකියා මට්ටම
- ආයෝජනය
- ආර්ථික වෘද්ධිය
- ගෙවුම් ශේෂය
- විනිමය අනුපාතිකය
- මුදල් සැපයුම
- අපනයන / ආනයන

# යම් සූක්ෂ්ම හෝ සාර්ව ආර්ථික විචල්‍යයක,

- පවතින සැබෑ තත්වය පිළිබඳ කරන ප්‍රකාශ **යථානුරූපී ආර්ථික ප්‍රකාශ** නම් වේ.

උදා. - 2019 ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය 2.3% කි.

- පැවතියයුතු තත්වය පිළිබඳ කරන ප්‍රකාශ **අභිමතානුරූපී ප්‍රකාශ** නම් වේ.

උදා. - 2019 දී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය 3% ඉක්මවූයේ නම් ඉතා අගනේය.

## යථානුරූපී ප්‍රකාශ යනු,
## l=ula o" l=ula jQfha o" l=ula jkq we;a o wd§ m%Yakj,g ms<s;=re §u i|yd fhduq jQ iy m%ldYfha ksrjoH;dj mÍlaIdjg ,la l< yels m%ldY h:dkqrEms m%ldY kï fõ'

**යථානුරූපී ප්‍රකාශයක ලක්ෂණ**

- නිවැරදිතාව සැබෑලොව කරුණු ඇසුරින් පැහැදිලි කිරීමට හැකි වීම.
- ඒ අනුව නිවැරදි නම් පිළිගැනීමටත්, නිවැරදි නොවේ නම් ප්‍රතික්ෂේප කිරිමටත් හැකි වීම.
- යම් විද්‍යාත්මක භාවයක්, න්‍යායාත්මක භාවයක් පෙන්වීම.
- දැඩි සේ විෂයානුබද්ධ වීම.
- ආර්ථික සංසිද්ධි පැහැදිලි කිරීමට යොදා ගැනීම.
  - උදා-
    - මුදල් සැපයුම සහ මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.
    - මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී.
    - ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන අනුපාතිකය 1%කි.

## අභිමථානුරූපී ප්‍රකාශ යනු,
## iudch ;=< mej;sh hq;af;a l=ula o  isoqúh hq;af;a l=ula o hkak ms<sn| j bÈßm;a ù we;s m%ldY wNsu;dkqrEms m%ldY h'

**අභිමථානුරූපී ප්‍රකාශයක ලක්ෂණ**

- විශ්වාසය, සාරධර්ම, පුද්ගල මතිපතාන්තර මත රැඳී පවතින නිසා දැඩි සේ පුද්ගලානුබද්ධ වීම.
- සත්‍ය හෝ අසත්‍ය බව ඔප්පු කළ නොහැකි වීම.
- යම් අරමුණක් මූලික කරගත් පැහැදිලි කිරීමක ස්වරූපය ගැනීම.
- ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ විග්‍රහයන් සඳහා වැඩිපුර යෙදීම.
    - උදා
    - සෑම රාජ්‍ය සේවකයකුගේ ම මාසික වැටුප රුපියල් 5000කින් වැඩි කළ යුතු ය.
    - ශ්‍රී ලංකාව සංවර්ධනයට විදේශාධාර ලබාගත යුතු ය.
    - සෑම පුරවැසියකුට ම නොමිලේ වෛද්‍යාධාර ලබා දිය යුතු ය.
    - සෑම පුද්ගලයකුට ම සමාන ආදායමක් ලැබිය යුතු ය.
    - ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි වේගය 8% මට්ටමේ පවත්වා ගත යුතු ය.

# ‘අවශ්‍යතා‘ හා ‘වුවමනා‘ යන යෙදුම් ආර්ථික විද්‍යා විෂයේදී එකිනෙකට වෙනස් තේරුම් දෙකක් ලබා දේ.

- ✓ මිනිසුන්ට ජීවත් වීම සඳහා අවශ්‍ය කරන මූලික ම දෑ “ අවශ්‍යතා “ නමින් හැඳින්වේ.

- ✓ අවශ්‍යතා ඉටුකරගන්නා විවිධ ස්වරූප “වුවමනා “ නමින් හැඳින්වේ.

# අවශ්‍යතාව වුවමනාව

## ආහාර

- බත්
- පාන්
- කෙසෙල්
- පළතුරු බීම
- බිස්කට්

අවශ්‍යතාව

වුවමනාව

ඇදුම්

- කමිස
- කලිසම්
- සාරි
- සරම්
- ගවුම්

# අවශ්‍යතා හා වුවමනා අතර වෙනස

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • ජීව විද්‍යාත්මක මූලයන් හා සම්බන්ධය | • සංස්කෘතිකමය මූලයන් හා සම්බන්ධය |
| • සීමිතය | • අසීමිතය |
| • කාලයත් සමග නොවෙනස්ය | • කාලයත් සමග වෙනස් වේ |
| • සියලු මානවයන්ට පොදුය | • පුද්ගලානුබද්ධය |

"ආදරය, රැකවරනය ආදිය මානසික වුවමනා ලෙස සැලකෙන අතර ආර්ථික විද්‍යාවේදී අවධානය යොමු කරන්නේ භාන්ඩ හෝ සේවාවන් පරිබෝජනයෙන් තෘප්තිමත් කළ හැකි ද්‍රව්‍යාත්මක වුවමනා ගැන පමණි."